ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## <u>දකුණු ආසියානු විශ්ව විද්‍යාලය (SAU) අධ්‍යයන වර්ෂ 2024-25 සඳහා පශ්චාත් උපාධි සහ ආචාර්ය උපාධි පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවයි</u>

දකුණු ආසියානු විශ්ව විද්‍යාලය අධ්‍යයන වර්ෂ 2024-25 සඳහා පශ්චාත් උපාධි සහ ආචාර්ය උපාධි පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවා ඇත. දකුණු ආසියානු විශ්ව විද්‍යාලය පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ශිෂ්‍යත්ව 75ක් ද ආචාර්ය උපාධි සඳහා ශිෂ්‍යත්ව 25ක් ද පිරිනමයි.

2. https://sau.int/admissions/admission-notice-2024/ යන වෙබ් අඩවිය හරහා අයදුම්පත් යොමු කළ යුතු අවසාන දිනය 2024 මාර්තු 31 වන දින වේ. ඇතුළත් කරගැනීමේ විභාගය 2024 අප්‍රේල් 20 සහ 21 දිනවල පැවැත්වේ. වැඩිදුර විස්තර දකුණු ආසියානු විශ්ව විද්‍යාලයේ වෙබ් අඩවියේ (sau.int) දැක්වෙන ඇතුළත් කර ගැනීම පිළිබඳ විස්තර ඇතුළත් පත්‍රිකාවෙන් දැනගත හැකිය.

3. දකුණු ආසියානු විශ්ව විද්‍යාලය 2010 වසරේ පිහිටුවන ලද්දේ දකුණු ආසියානු කලාපයේ තරුණ තරුණියන් සඳහා ලෝක මට්ටමේ දැනුමක් ලබා දීමේ සහ කලාපය පිළිබඳ හැඟීමක් ඇති කිරීමේ අරමුණිනි. එය කලාපීය සහයෝගීතාවය සඳහා දකුණු ආසියානු සංගමයට අයත් රටවල (ඇෆ්ගනිස්ථානය, බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, පාකිස්ථානය සහ ශ්‍රී ලංකාව) ඒකාබද්ධ මුලපිරීමකි.

***

කොළඹ
2024 මාර්තු 21